// නැඇසහ

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2082/54 – 2018 අගෝස්තු 02 වැනි බ්‍රහස්පතින්දා – 2018.08.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/COM/02/2017/147.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත 4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2018.04.25 වැනි දින අංක 2068/20 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2018.04.10 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ටී. නෙල්සන් ඒ. ප්‍රනාන්දු මයා, අංක 608/1, ගාලු පාර, පානදුර.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර පවත්නා 2018.03.22 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳ වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නන්දසේන බැදිගම මහතා වෙත යොමු කරන ලදී.

1A – G 28215 – 17 (2018/08)
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2018.04.10 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**රවින්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

08 - 617/1

*මගේ අංකය* : IR/COM/02/2017/147.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ටී. නෙල්සන් ඒ. ප්‍රනාන්දු මයා, අංක 608/1, ගාලු පාර, පානදුර.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කටුගස්තොට, ගොහාගොඩ පාර, නො. 599, එච්. එම්. අනුලාවතී මෙනෙවිය පත් කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවින්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2017/147.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ටී. නෙල්සන් ඒ. ප්‍රනාන්දු මයා, අංක 608/1, ගාලු පාර, පානදුර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කළුතර ප්‍රාදේශිකයේ V වන ශ්‍රේණියේ නිලධාරි (උසාවි කටයුතු) ලෙස සේවය කළ ටී. නෙල්සන් ඒ. ප්‍රනාන්දු මයා එම තනතුරෙන් විශ්‍රාම ගැන්වීමෙන් පසු 2011.05.02 වැනි දින සිට 2015.10.28 වැනි දින දක්වා කොන්ත්‍රාත් පදනම යටතේ එකී තනතුරේම සේවය ලබා එම තනතුරට අදාළ නියමිත වැටුප, වාර්ෂික වැටුප් වර්ධක හා වැඩි වූ දීමනා ලබා නොදී සේවය ලබා ගැනීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න සහ එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ."

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජූලි මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ කාර්යාලයේ දී
දින යොදන ලදී.

08 – 617/2

---

*මගේ අංකය* : IR/COM/01/2017/186.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. ඩබ්. චන්ද්‍රසේකර බංඩා මයා, අංක 372, 39 ඇල, වේරගංතොට.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, තලවතුගොඩ, නුගේගොඩ පාරෙන් එහා, එකමුතු මාවත, නො. 570/බී/1, පී. නවරත්න මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවින්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2017/186.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. ඩබ්ලිව්. චන්ද්‍රසේකර බංඩා මයා, අංක 372, 39 ඇල, වේරගංතොට.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ උඩුදුම්බර ඩිපෝවේ ජොෂ්ඨ ඩිපෝ පරීක්ෂකවරයෙක් වශයෙන් සේවය කළ ඒ. ඩබ්. චන්ද්‍රසේකර බංඩා මහතාට, 2015 අගෝස්තු මස සිට එම තනතුරට අදළ වැටුප නොගෙවීම යුක්ති සහගත ද ? එසේ නොවේ නම් ඒ මහතාට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ."

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජූලි මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

08 – 618

---

*මගේ අංකය* : IR/COM/01/2017/246.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව -

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ප්‍රොටෙක්ට්, අංක 475/4, තිඹිරිගස්යාය පාර, කොළඹ 05. (සේවකයින් 43 දෙනෙකු වෙනුවෙන්)

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ඔපෝ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 321, 4 වන මහල, ලක්ෂ්මන් ගොඩනැගිල්ල, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ

ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කළුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, අංක 242, ඕබඩගේ ලීලාරත්න මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2017/246.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ප්‍රොටෙක්ට්, අංක 475/4, තිඹිරිගස්යාය පාර, කොළඹ 05. (සේවකයින් 43 දෙනෙකු වෙනුවෙන්)

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ඔපෝ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 321, 4 වන මහල, ලක්ෂ්මන් ගොඩනැගිල්ල, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

"ඔපෝ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ උපලේඛන (1) හි දැක්වෙන සේවකයින් සිය සේවා ධුරවලින් පහත දැමීමෙන් සහ උපලේඛන (2) හි දැක්වෙන සේවකයින් ස්ථාන මාරු කිරීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ."

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජූලි මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

*උපලේඛන* (1)

**තනතුරෙන් පහත හෙලන ලද සේවක නාමලේඛනය**

01. එස්. ඒ. අයි. ඒ. පෙරේරා
02. ඩබ්. ඩී. එස්. එච්. පී. විජේසිංහ
03. එච්. එම්. අකීල්
04. එම්. ඩී. ඩී. එස්. ගුණතිලක
05. එච්. පී. කැළුම් සඳරුවන්
06. එම්. සල්මාන්
07. ආර්. යෝගරාජා
08. ඩබ්. එච්. ධනුෂ්ක
09. එම්. එච්. ලක්මාල්
10. එම්. ආර්. කුමාර
11. ඩබ්. ඩී. ස්ටෙෆන්

12. කේ. එස්. නිලන්ක
13. කේ. ඩී. එච්. එන්. නුවන්ත
14. සී. ජේ. බී. මීගොල්ල
15. ඩබ්. එම්. එස්. බණ්ඩාර
16. එම්. එන්. හර්ෂිත
17. පී. එන්. ඒ. කුමාර
18. එච්. එම්. එන්. ඒ. ශාන්ත
19. එස්. ඒ. ටී. මධුරංග
20. එම්. ඒ. සී. මධුසංඛ
21. ජේ. ඒ. ඩී. ඒ. දිනූක
22. එම්. කේ. එම්. සී. වික්‍රමසූරිය
23. ඒ. සී. අයි. අබේගුණවර්ධන
24. ජේ. එම්. ඒ. සශ්මින්
25. කේ. ඒ. බී. රිෂ්හාන්
26. එම්. එන්. එස්. ප්‍රනාන්දු
27. ඩී. එම්. ඩී. ආර්. කුමාර
28. එම්. එන්. අයි. හසන්

### උපලේඛන (2)

### ස්ථාන මාරු කරන ලද සේවක නාමලේඛනය

01. ජේ. ඩබ්. ඩී. බුද්ධි කුමාර
02. පී. එම්. සී. තිසේරා
03. බී. වී. පී. මාලිංග
04. එස්. ඒ. එන්. ආර්. සමරසිංහ
05. ජේ. එච්. කේ. විදූෂානි
06. ඊ. පී. ආර්. ඉසංක
07. එම්. ජී. එන්. බී. මධුවන්ත
08. එම්. ඒ. ටී. කුරේ
09. එම්. රෂීඩ්
10. එස්. එම්. එම්. ජිෆ්රාන්
11. බී. ඒ. එස්. වික්‍රමසිංහ
12. ජේ. ඒ. ඩී. එන්. පෙරේරා
13. එස්. කේ. කේ. සාලින්ද
14. ඩී. එම්. ඩී. එස්. කළුපෙරුම
15. බී. එම්. පෙරේරා

08 – 619

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.